# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා හා බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2014 මාර්තු මස 21 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2014 මාර්තු මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[295 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2–PL008070–525 (2014/03)

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යන රක්ෂණකරුවකු විසින් ගෙවනු ලබන ආදායම් බද්දෙන් සේවා ගාස්තු අඩු කිරීමට අවසර දීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි නීතියේ බලපෑම වනුයේ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 106 වන වගන්තියට අනුකූල වන පරිදි තක්සේරු වාර්තාවක් හෝ අතිරේක තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කිරීමේ දී අදාළ වන කාල කඩඉම් විධිවිධාන ගෙන ඒම වේ.

# ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)

එල්. ඩී.—ඕ. 7/2014.

## 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.*

**1.** මේ පනත 2014 අංක    දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2014 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක විය යුතු ය.

*2006 අංක 13 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**2.** 2008 අංක 11 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"(3අ) දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයක් සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක් යන ව්‍යාපාර දෙකම කරගෙන යනු ලබන යම් රක්ෂණකරුවකු විසින්, 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වන වගන්තිය මගින් නියමකර ඇති ආකාරයට එම ව්‍යාපාරය සමාගම් දෙකක් විසින් පවත්වාගෙන යෑම සඳහා දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වශයෙන් වෙන් කරනු ලබන අවස්ථාවක දී, (1) වන, (2) වන හෝ (3) වන උපවගන්තිවලට අනුකූලව අඩුකිරීමෙන් පසුව එම වෙන් කරනු ලැබීම කරන ලද දිනයේ දී ආර්ථික සේවා ගාස්තු වශයෙන් අයකරනු ලැබූ මුදලේ යම් ශේෂයක් ඇත්නම් එම ශේෂය මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොසලකා, මෙන්ම මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, එම වෙන් කිරීමෙන් පසුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සමාගම විසින් ස්වකීය ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන ගිය ලෙස සලකා, එම සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** 2007 අංක 15 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"(4) (අ) 7 වන වගන්තියේ සඳහන් දිනවල දී හෝ එදිනට පෙර යම් තක්සේරු වර්ෂයක යම් අදාළ කාර්තුවක් සඳහා වාර්තාවක් ඉදිරිපත් කර ඇති යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඔහුගේ හෝ එහි ආදායම් වාර්තාව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 106 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (7) වන උපවගන්තිය යටතේ ඉදිරිපත්කර ඇත්නම්—

(i) එම කාර්තුව 2014 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන්වන යම් අදාළ කාර්තුවක් වන අවස්ථාවක දී අදාළ කාර්තුව ඇතුළත්වන තක්සේරු වර්ෂය අවසානයේ සිට මාස දහඅටක් ගතවීමෙන් පසුව; හෝ

(ii) එම කාර්තුව 2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් අදාළ කාර්තුවක් වන අවස්ථාවක දී එම කාර්තුව ඇතුළත්වන තක්සේරු වර්ෂයට ඉක්බිතිවම වූ තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස තිස්වන දින සිට මාස දහඅටක් ගතවීමෙන් පසුව; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් දිනයේ දී හෝ එම දිනයට පෙර වාර්තාවක් ඉදිරිපත් කිරීමට ඔහු හෝ ඇය විසින් අපොහොසත්වන අවස්ථාවක දී, එම කාර්තුව ඇතුළත්වන තක්සේරු වර්ෂයට ඉක්බිතිවම වූ තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස තිස්වන දින සිට අවුරුදු හතරක කාලයක් ගතවීමෙන් පසුව,

මේ පනත යටතේ කිසිම තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් නොකළ යුතු ය.”.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.